කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

---

## 2020 නොවැම්බර් මස 26 දින සඳහා කාලගුණ අනාවැකිය
## 2020 නොවැම්බර් මස 25 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "නිවාර්" චන්ඩ සුළි කුණාටුව අද (25) උදැසන 08.30 වන විට ලංකාවේ කන්කසන්තුරය වෙරළට කි.මී. 213 ක් ඊසාන දෙසින් (10.7N, 81.7E) ස්ථානගතව පැවතුනි. එය ඉදිරි පැය 06 ක කාලය තුල ඉතා චන්ඩ සුළි කුණාටුවක් බවට වර්ධනය වෙමින් දිවයිනේ උතුරු වෙරළ ආසන්නයෙන් ගමන් කර, අද(25) දින මධ්‍යම රාත්‍රියේදී ඉන්දියාවේ තමිල්නාඩු වෙරළ හරහා ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**

**වයඹ, බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් යාපනය, මන්නාරම, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වලත් වැසි වාර කිහිපයක් ඇතිවේ.**

**ඌව පළාතෙත් අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවලත් ස්ථාන ස්වල්පයක සවස 2.00 න් පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.**

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 26th NOVEMBER 2020
## Issued at 12.00 noon on 25th November 2020

**The Severe Cyclonic Storm "NIVAR" over southwest Bay of Bengal is located near (10.7N, 81.7E) at 08.30hrs today (25), 213 km to the north-east of Kankasanthurai coast. It is very likely to intensify into a very Severe Cyclonic Storm during next 06 hours and expected to move closer to the Northern coast of Sri Lanka and cross Tamil-Nadu coast, India during mid night of today(25).**

Several spells of showers will occur in North-western, Western and Sabaragamuwa provinces and in Jaffna Mannar, Galle and Mathara districts.

Showers or thundershowers may occur at a few places in Uva province and in Ampara and Batticaloa districts after 2.00 p.m.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2020 නොවැම්බර් මස 25 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**විශේෂ නිවේදනය**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින “නිවාර්” චන්ඩ සුළි කුණාටුව අද (25) උදෑසන 08.30 වන විට ලංකාවේ කන්කසන්තුරය වෙරළට කි.මී. 213 ක් ඊසාන දෙසින් (10.7N, 81.7E) ස්ථානගතව පැවතුනි. එය ඉදිරි පැය 06 ක කාලය තුල ඉතා චන්ඩ සුළි කුණාටුවක් බවට වර්ධනය වෙමින් දිවයිනේ උතුරු වෙරළ ආසන්නයෙන් ගමන් කර, අද(25) දින මධ්‍යම රාත්‍රියේදී ඉන්දියාවේ තමිල්නාඩු වෙරළ හරහා ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**

**එබැවින් (07N-16N සහ 80E-87E) අතර මුහුදු ප්‍රදේශවල නිරන්තර වැසි, තද හෝ ඉතා තද ප්‍රභාරාත්මක සුළං සහ රළු හෝ ඉතා රළු මුහුදු ප්‍රදේශ ඇතිවිය හැක.**

**වැසි තත්ත්වය:**

**පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.**

**සුළඟ:**

**පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං වයඹ සිට බස්නාහිර දක්වා දිශාවලින් හමන අතර සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (80-100) දක්වා ඉහළ යාමට හැකියාවක් පවතී. සෙසු මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දිශාවෙන් හමයි. පුත්තලම සිට කොළඹ හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) දක්වා ඉහළ යාමට හැකියාවක් පවතී. සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ.**

**මුහුදේ ස්වභාවය:**

**පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු හෝ දළ රළු විය හැකි බැවින් මෙම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.**

**පුත්තලම සිට කොළඹ හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැකි බැවින් මෙම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවල යෙදීමේදී වඩාත් අවධානයෙන් පසුවිය යුතු බව දැනුම් දෙනු ලැබේ.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 12.00 noon on 25 November 2020**

**Special Notice**

**The Severe Cyclonic Storm "NIVAR" over southwest Bay of Bengal is located near (10.7N, 81.7E) at 08.30hrs today (25), 213 km to the north-east of Kankasanthurai coast. It is very likely to intensify into a very Severe Cyclonic Storm during next 06 hours and expected to move closer to the Northern coast of Sri Lanka and cross Tamil-Nadu coast, India during mid night of today(25).**

**As such, intemittent showers/thundershowers, strong or very strong gusty winds and rough or very rough seas can be expected in the sea areas in between (07N-16N and 80E-87E) .**

**Condition of Rain:**

Intemittent showers or thundershowers will occur in the sea areas extending from Puttalam to Batticaloa via Mannar, Kankasanthurai and Trincomalee.

**Winds:**

Winds will be north-westerly to westerly and wind speed can increase up to **(80-100) kmph** at times over sea area extending from Puttalam to Batticaloa via Mannar, Kankasanthurai and Trincomalee.
Winds will be south-westerly in the other sea areas around the island.
Wind speed can increase up to **(50-60) kmph** at times over sea area extending from Puttalam to Hambanthota via Colombo. Wind speed will be 30-40 kmph in other sea areas.

**State of Sea:**

The sea areas extending from Puttalam to Batticaloa via Mannar, Kankasanthurai and Trincomalee will be very rough or high at times. Naval and fishing communities are advised not to venture these sea areas.
The sea areas extending from Puttalam to Hambanthota via Colombo will be fairly rough at times. Naval and fishing communities are request to be vigilant in this regard.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි